www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ලසසපයේ දේශපාලන කුනුවීම

## Sri Lanka: The political decomposition of the LSSP

විලානි පීරිස් විසිනි
2010 අප්‍රේල් 29

අප්‍රේල් 8 පාර්ලිමේන්තු මැතිවරනය ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප) කුනුවීම යලිත් වරක් අවධාරනය කර තිබේ. 1940 සහ 1950 ගනන්වල දී, මෙම පක්ෂය ට්‍රොට්ස්කිවාදය සඳහා අරගලයේ පදනම මත කම්කරුවන්ගේ වඩාත්ම සටන්කාමී හා පන්ති විඥාන කොටස්වල පක්ෂපාතිත්වය දිනාගත්තේය. අද, 1964 දී මෙම මූලධර්ම පාවාදීමෙන් පසුව, එය වනාහි පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) කීකරු කොටස්කරුවකු ලෙස ක්‍රියාත්මක වන කුනු වූ මලකඳකි.

වසර ගනනාවක් තිස්සේ කලාක් මෙන්, ලසසප මෙවර මැතිවරනයේ දී ද තරග කලේ තම ධජය යටතේ නොව එජනිස යටතේය. එයට දිස්ත්‍රික්ක පහක අපේක්ෂකයන් පහක් ඉදිරිපත් කිරීමට ඉඩ දෙන ලදි. පක්ෂය එයින් දිනාගත්තේ එක ආසනයක් පමනි. ඒ කෑගල්ල දිස්ත්‍රික්කයේ සාපේක්ෂව අප්‍රසිද්ධ සාමාජිකයකු වන වයි.ජී. පද්මසිරිය. එජනිසය තුල ඇති කර ගෙන තිබූ එකඟතාවන්ට අනුව, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) වත්මන් ලසසප නායකයා වන තිස්ස විතාරනට ජාතික ලැයිස්තු ආසනයක් වෙන් කලේය.

ඇමතිකම් බෙදා දුන් ආරම්භක අවස්ථාවේ දී, කලින් පැවති රාජපක්ෂ ආන්ඩුවේ විද්‍යා හා තාක්ෂන ඇමති වූ විතාරන නොසලකා හැර තිබේ. තම පක්ෂය නොතකා හැරීම ගැන ලසසප රාජපක්ෂට ඉදිරියේ අඳෝනා නැගීමෙන් පසුව, පෙනී යන්නේ, දකුනු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ රැස්වීමට සහභාගි වී ජනාධිපති අප්‍රේල් 30 දා පෙරලා පැමිනීමෙන් අනතුරුව විතාරනට ඇමති තනතුරක් ලැබීමට ඉඩ ඇති බවයි.

මෙම දීන යටහත්පහත්කම, පසුගිය සිවු වසර තිස්සේ රාජපක්ෂගේ සියලු කම්කරු-විරෝධී පිලිවෙත්වලට හා අපරාධවලට ලසසප දුන් සහයෝගය තුල පිලිබිඹු වේ. දහස් සංඛ්‍යාත සිවිල් වැසියන්ගේ මරනයට මෙන් ම පසුගිය මැයි මාසයේ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරාජයෙන් පසුව මිනිසුන්, ගැහැනුන් හා ළමුන් දෙලක්ෂ පනස් දහසකට වැඩි සංඛ්‍යාවක් රඳවාගැනීමට ද තුඩු දුන් එල්ටීටීඊයට එරෙහිව රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධයට ලසසප සහයෝගය දුනි.

වර්ගවාදී යුද්ධයට ලසසප දුන් සහයෝගය සෘජුවම ගලා එන්නේ, 1964 දී සිරිමා බන්ඩාරනායකගේ ධනේශ්වර ශ්‍රීලනිප නායකත්වයෙන් යුක්ත සභාග ආන්ඩුවට එය ඇතුලු වීම මගින් ට්‍රොට්ස්කිවාදී මූලධර්ම පාවාදීම වෙතිනි. සමාජවාදී ජාත්‍යන්තරවාදයට සටන් වැද තිබූ දෙමල වතු කම්කරුවන්ගේ පුරවැසි අයිතිය ආරක්ෂා කර තිබූ සහ ශ්‍රීලනිපයේ වර්ගවාදී "තනි සිංහල" භාෂා පිලිවෙතට විරුද්ධ වී තිබූ ලසසප, සමාජ විප්ලවය පිලිබඳ සිය පෙර වැඩපිලිවෙල කුනුකූඩයට දමා පාර්ලිමේන්තුවාදය සහ බන්ඩාරනායක ආන්ඩුවේ සිංහල ස්වෝත්තමවාදය වැලඳගත්තේය.

ලසසපයේ පාවාදීම වනාහි, මයිකල් පැබ්ලෝගේ සහ අර්නස්ට් මැන්ඩෙල්ගේ නායකත්වයෙන් යුක්ත අවස්ථාවාදී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර ලේකම් මන්ඩලය විසින් සෑම පියවරක දී ම දිරිගන්වන ලද දිග්ගැසුනු ජාතිකවාදී පරිහානියක ප්‍රතිඵලය විය. එහි පූර්න ඇඟවුම් පැහැදිලිව දක්නට ලැබුනේ 1970 දී බලයට පැමිනි දෙවන බන්ඩාරනායක ආන්ඩුව තුල ය. ලසසප 1971 දී පැනනැගි ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) නොමග ගිය කැරැල්ල රුදුරු ලෙස මර්දනය කිරීමට සහයෝගය දුන් අතර එම මර්දනයේ ප්‍රතිඵලය ලෙස අඩු ගනනේ ග්‍රාමීය සිංහල තරුනයන් 15,000ක් ඝාතනය කෙරුනි.

ලසසප නායකයෝ බන්ඩාරනායක ආන්ඩුවේ මූලික කැබිනට් ඇමති තනතුරු දැරූහ. වැව්ලි කර්මාන්ත හා ව්‍යවස්ථා කටයුතු ඇමති ලෙස, කොල්වින් ආර් ද සිල්වා, රාජ්‍ය භාෂාව ලෙස සිංහලත් රාජ්‍ය ආගම ලෙස බුද්ධාගමත් පිහිටුවාලූ 1973 ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වගකිව යුත්තා විය. එම ව්‍යවස්ථාව දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ සෙසු නිල පිලිවෙත් සමග එක්ව, අවසානයේ වර්ගවාදී යුද්ධය සඳහා පාර කැපීය. මුදල් ඇමති ලෙස එන්.එම්. පෙරේරා, 1974-75

ගෝලීය ආර්ථික පසුබැස්මේ බර වැඩ කරන ජනතාවගේ කර මත හෙලීය. එය දැවැන්ත දුෂ්කරතා සහ වද වේදනාවන්ට තුඩු දුනි.

ලසසප 1975 දී සභාගයෙන් එලියට විසි කෙරුනු අතර, ශ්‍රීලනිප මෙන් ම, දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) බලයට ගෙන ආ, 1977 මැතිවරනයේ දී නින්දිත පරාජයක් අත්වින්දේය. එජාප වෙලඳ පොල-හිතැති ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ක්‍රියාවට දැමූ අතර, සමාජ ආතතීන් වැඩෙන තතු යටතේ, එල්ටීටීඊයට එරෙහි යුද්ධය තුලට දිවයින ඇදදැමීය. ලසසප එම යුද්ධයට සහයෝගය දුනි. ඉන් පසුව, ලසසප ශ්‍රීලනිප සමග නව සභාගයකට එක් වූ අතර එමගින් 1994 දී ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග බලයට ගෙන එන ලදි. එතැන් පටන් ලසසප ස්වාධීන පක්ෂයක් ලෙස සිය පැවැත්ම මුලුමනින්ම පාහේ අහිමි කර ගෙන තිබේ.

කොලඹ නගර මධ්‍යයේ පිහිටි අඳුරු ගුහාවක් වැනි එහි මූලස්ථානය මෙන් ම, ලසසප ද හිස් කෝම්බයකට වැඩි යමක් නොවේ. කලක් විප්ලවවාදී ට්‍රොට්ස්කිවාදය සඳහා සටන් වැද පසුව එම මූලධර්ම පාවාදුන් නායකයන් බොහෝ දෙනෙක් දැන් මිය ගොස්ය. නව නායක පරම්පරාව තුලට පාර්ලිමේන්තු උපාමාරු දේශපාලනය මුලුමනින්ම කාවැදී තිබේ. වෛද්‍යවරයකු හා එන්.එම්. පෙරේරාගේ ඥාතියකු වන තිස්ස විතාරන 1950 ගනන් අග දී ලසසපට බැඳුනු අතර පෙරේරාගේ සහායකයකු ලෙස කටයුතු කලේය. ඔහු 2004 දී ජාතික ලැයිස්තු ආසනයකින් පාර්ලිමේන්තුවට ඇතුලු වූ අතර එමගින් පක්ෂයේ එකම පාර්ලිමේන්තු මන්ත්‍රී හා නායකයා බවට පත්විය.

ලසසප නායකත්වය වචනාර්ථයෙන් ම ශ්‍රීලනිපයේ සාක්කුවට වැටී ඇත. එහි දේශපාලන කමිටුවේ සාමාජිකයන් 13න් ඇමති තනතුරක් යලි ලැබීමට ඉඩ ඇති විතාරනට අමතරව, තවත් අට දෙනෙක් වැටුප් ලබන ආන්ඩුවේ "උපදේශක" තනතුරු දරති. පක්ෂය සිය සාමාජිකත්වය 700ක් බව කියාපාන නමුදු පක්ෂ රැස්වීම්වලට පැමිනෙන්නේ 150කට නොවැඩි සංඛ්‍යාවකි. එහි "මාසික" පුවත්පත වන සමසමාජය පලවන්නේ ඉඳහිටය.

ලසසප තව දුරටත් තමන්ට ජනාධිපති රාජපක්ෂගේ ඊනියා මහින්ද චින්තනයෙන් වෙනස් ස්වකීය වැඩපිලිවෙලක් ඇති බවක් මවාපාන්නේ වත් නැත. සන්ඩේ ඔබ්සවර් පත්‍රයට දුන් සම්මුඛ සාකච්ඡාවක දී අලුතෙන් තේරී පත් වූ මන්ත්‍රී පද්මසිරි මෙසේ පැහැදිලි කලේය: "මගේ මැතිවරන ව්‍යාපාරයේ ප්‍රධාන තේමාව වූයේ මහින්ද චින්තන ඉදිරිදැක්ම සමග බෙහෙවින් ගැලපෙන ලසසප දෘෂ්ටිවාදය හා පිලිවෙත්ය."

ලසසපට පෙරදී පුද්ගලික හා රාජ්‍ය යන අංශ දෙක තුලම, අරගල පිලිබඳ දිගු ඉතිහාසයක් සහිත විශාල වෘත්තීය සමිති පැවතුනි. ඒවායින් බොහොමයක් මුලුමනින්ම දියවී ගොස් ඇති අතර ඉතිරිව ඇති අතලොස්ස කිහිප සියයක් සාමාජිකයන් සහිත හුදු නාමමාත්‍රික සංවිධානවලට වඩා වැඩි යමක් නොවේ. ලසසප සමිති පවතින තාක් දුරට, ඒවා සිදු කරන්නේ, කම්කරුවන්ගේ මොන යම් හෝ විරුද්ධත්වයක් මැඩීම පිනිස ආන්ඩුවේ සමිති ගොන්නට සහයෝගය දීමේ මුලුමනින්ම ද්‍රෝහී ක්‍රියාකලාපයකි.

පක්ෂය මුලුමනින්ම කඩාවැටීමක් වලක්වාගන්නේ කෙසේද යන්න පිලිබඳව ලසසප නායකත්වය තුල සාකච්ඡාවක් සිදු වෙමින් පවතී. ඇමති තනතුරු භාර නොගැනීම ද ආන්ඩුව විවෘතව ම ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීම ගැන සීමිත විවේචන සිදු කිරීම ද මගින් පක්ෂය ආන්ඩුවෙන් දුරස්ථ විය යුතු යයි අවවාද කරමින් ලාල් විජේනායක මීට වසරකට වැඩි කලකට ඉහත දී පක්ෂ නායකත්වය වෙත ලිපියක් යැවීය. විජේනායක, "ප්‍රජාතන්ත්‍රිකයකු ලෙස සාවද්‍ය වෙස්පෑමක් කරමින් පසුගිය ජනවාරියේ දී එජාපයේ "නිදහසේ වේදිකාව" මත දී එම දක්ෂිනාංශික පක්ෂය සමග එක්විය. රාජපක්ෂගේ උදහස ගැන බියෙන්, ලසසප වහාම විජේනායකගේ පක්ෂ මධ්‍යම කාරක සභා සාමාජිකත්වය අත්හිටුවීය.

සිය වාසි සහගත අවස්ථාවන් වැඩිදියුනු කර ගැනීමේ උත්සාහයක් ලෙස, ලසසප සිය දිගුකාලීන හවුල්කරු වන ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය ද ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුන (ප්‍රවාපෙ) සහ දේශ විමුක්ති ජනතා පෙරමුන වැනි හිටපු රැඩිකල් කන්ඩායම් ද සමග එක්ව සමාජවාදී ජනතා පෙරමුන (සජපෙ) තැනීය. සජපෙ පාර්ලිමේන්තුවාදී නැඹුරුව පසුගිය සතියේ අවධාරනය කෙරුනේ, ලසසප මූලස්ථානයේ පැවති රැස්වීමකින් පසුව, ප්‍රවාපෙ නායක වාසුදේව නානායක්කාරට ඇමති තනතුරක් ලබාදෙන ලෙස ශ්‍රීලනිපයට ආයාචනා කිරීමට එය යෝජනාවක් සම්මත කරගත් විටය.

රාජපක්ෂට මෙම හිටපු වාමාංශිකයන්ගේ සේවය පිලිබඳ යම් අවශ්‍යතාවක් පවතින්නේ නම්, ඒ ආන්ඩුවේ ප්‍රතිගාමී පිලිවෙත්වලට තුනී ආවරනයක් සැපයීමයි. පැවති ආන්ඩුව තුල ලසසප නායක විතාරනගේ ප්‍රධාන කාර්යය වූයේ විද්‍යා කටයුතු ඇමති ලෙස නොව, දෙමල සුලුතරයේ දුක්ගැනවිලිවලට " දේශපාලන විසඳුමක් " සූදානම් කරනු පිනිස 2006 මැයි මස පිහිටුවන ලද සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ (සපානික) සභාපති ලෙසය. විතාරන එම කමිටුවේ විවිධ යෝජනා සමග කාල් ගාමින් සිටින අතරතුර, රාජපක්ෂ මිලිටරිය සූදානම් කොට 2006 ජුලි මස දී රට යලි යුද්ධයට ඇද දැම්මේ 2002 සටන්විරාමය බරපතල ලෙස උල්ලංඝනය කරමිනි.

පසුගිය සතියේ පැවති සජපෙ රැස්වීමක දී, විතාරන මෙසේ ප්‍රකාශ කරමින් ආන්ඩුවට හුරේ දැමීය:

"මේ රට තුල දී ජනතාව මේ ආන්ඩුවට ඉතා හොඳ ජනවරමක් දීලා තියෙනවා. ජනතාව මේ ජනවරම දීලා තියෙන්නෙ අධිරාජ්‍යවාදයට විරුද්ධ අරගලය දිගටම ගෙනයන්නයි. අපි මේ ගැන ජනතාව දැනුවත් කරන්න ඕන. අපට ඒ වගකීම තියෙනවා." ලසසප අධිරාජ්‍යවාදයට එරෙහි මොන යම් හෝ අව්‍යාජ අරගලයක් අත්හැර දැම්මේ මීට දශක ගනනාවකට ඉහත දී ය. විතාරන කරන්නේ, මිලිටරියේ මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් එක්සත් ජනපදය හා යුරෝපා සංගමය කරන ඉතා සීමිත විවේචන ප්‍රතිමුඛ කරනු පිනිස සැලසුම් කෙරුනු රාජපක්ෂගේ ප්‍රචාරක ව්‍යාපාරය, පුනරුච්චාරනය කිරීමක් පමනි.

විතාරන කැබිනට් තනතුරක් සඳහා උපාමාරු දමන අතරතුර, රාජපක්ෂ ආන්ඩුව ගැඹුරු වන ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉල්ලා සිටින කප්පාදු වැඩපිලිවෙල ක්‍රියාවට දැමීමට සූදානම් වේ. කොලඹ සෙසු හිටපු වාම කල්ලි කන්ඩායම් මෙන්, විතාරන, රාජපක්ෂ ආන්ඩුවට එරෙහිව කම්කරු පන්තියේ මොන යම් හෝ ස්වාධීන ව්‍යාපාරයක් මර්දනය කිරීමේ ප්‍රයත්නය වෙනුවෙන් ලසසපයේ ඉතිරිව පවත්නා සියලු දේ යොදාගනු ඇත.

සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) පෙරගමන්කරු වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) 1968 දී පිහිටුවන ලද්දේ, ලසසපයේ ඓතිහාසික පාවාදීමට එහෙිව දේශපාලන අරගලයක් මගිනි. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සසප වනාහි, එලඹෙන පන්ති අරගලවල දී කම්කරු පන්තියට සිය මූලික අයිතීන් ආරක්ෂා කරගත හැකි එකම පදනම සම්පාදනය කරන ට්‍රොට්ස්කිවාදයේ විප්ලවවාදී මූලධර්ම දේහානුරූපව පවතින එකම පක්ෂයයි.

© www.wsws.org